සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகாமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර. රාජගිරිය. இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல: / My No. ED/02/09/සු.සැ. උ/2022 | ඔබේ අංකය. / உமது இல: / Your No. | දිනය / திகதி / Date 2024.09.06 |

සහකාර සුරාබදු කොමසාරිස් වරුන්
සුරාබදු අධිකාරිවරුන් හා සුරාබදු ස්ථානාධිපති වරුන් මගින්
සියලුම සුරාබදු කෝප්‍රල්වරුන්/කෝප්‍රල්වරියන්

<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කෝප්‍රල් තනතුරේ සිට සුරාබදු සැරයන් තනතුරට සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීම - 2022</u>

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කෝප්‍රල්වරුන් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත සුරාබදු සැරයන් තනතුරට උසස් කිරීම සඳහා සුදුසුස්සන් තෝරා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාව 14 කි.

02. මෙ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017.01.03 දින අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ 10.2.1 අනුව අයදුම්පත් කැඳවන දිනට සුදුසුකම් සපුරන ලද දෙපාර්තමේන්තුවේ සුරාබදු කෝප්‍රල්වරුන්ට අයදුම්පත් ඉදිරිපත් කල හැකිය.

ඒ අනුව සුදුසුකම් සපුරා ඇති සුරාබදු කෝප්‍රල්වරුන් තම අයදුම්පත පිටපත් 2 කින් සකසා එක් පිටපතක් සහකාර සුරාබදු කොමසාරිස් මගින් ඔවුන්ගේ නිර්දේශ සහිතවද අනෙක් පිටපත සෘජුවමද <u>2024 සැප්තැම්බර් මස 30වන දින හෝ ඊට පුරම ලැබෙන සේ</u> පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "සුරාබදු සැරයන් තනතුර සඳහා අයදුම්පත"යනුවෙන් සඳහන් කල යුතු අතර, නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් එවිය යුතු ලිපිනය:-

සුරාබදු කොමසාරිස් ජනරාල්
සුරාබදු දෙපාර්තමේන්තුව
353,කෝට්ටේ පාර
රාජගිරිය.

03. එසේම සැරයන් තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව මාසිකව රු.32,010-9*370-17*495-43,755/= ක්වූ RS 2-2016 වැටුප් පරිමාණයක් හිමිවේ. බඳවා ගැනීමේ පටිපාටියේ 8.1 හි සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

සැ.යු:මගේ අංක ED/02/09/සු.සැ.උ/2022 හා 2022/10/21 දිනැති නිවේදනය අනුව 2022 නොවැම්බර් මස 30 වන දිනට අයදුම්පත් යොමු කරන ලද නිලධාරීන්ද නැවත මේ සඳහා අයදුම් කල යුතුයි.

**3.1. <u>සපුරාලිය යුතු සුදුසුකම්</u>**

I. සුරාබදු කෝප්‍රල් තනතුරේ ස්ථිර කර තිබීම.

II. සුරාබදු කෝප්‍රල් තනතුරෙහි වසර (05) ක සේවා කාලයක් ඇතුලුව අවම වශයෙන් වසර අටක් (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අවම වශයෙන් යහපත් කල්ක්‍රියා ලාංජන දෙකක් (02) ලබා තිබීම.

VI. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

VII. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

**3.2 <u>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:</u>**

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| (1) සේවා පළපුරුද්ද<br>(සුදුසුකම් ලැබීමට වූ අවම සේවා කාලය හැර දෙපාර්තමේන්තුවේ සුරාබදු කෝප්‍රල්වරයෙකු වශයෙන් සේවය කර ඇති කාලය සඳහා ර.සේ.කො.1/2019 අනුව ලකුණු ලබා දෙනු ලැබේ. | 40 | |
| (2) කාර්ය සාධන ඇගයීම (පසුගිය වසර 05 සඳහා)<br>➢ අති විශේෂ -03<br>➢ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ -02<br>➢ සතුටුදායක - 01 | 15 | |
| (3) ලබා ඇති සාධු සටහන්<br>➢ විශේෂ සාධු සටහන් සඳහා - 02<br>➢ සාමාන්‍ය සාධු සටහන් සඳහා - 01 | 20 | අදාළ නොවේ |
| රන්වන් ලාංජනය ලබා තිබේ නම් | 05 | |
| (4) අදාල ක්ෂේත්‍රයේ පුහුණුව සඳහා<br>ඩිප්ලෝමාවක් සඳහා- 05<br>සති (02) දෙකකට වැඩි පුහුණුවක් සඳහා -02<br>දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහනක් සඳහා -02<br>(අදාල ක්ෂේත්‍රයේ පුහුණුව හැදෑරීමෙන් අනතුරුව ඉන් ලබා ඇති සහතික පත් අනුව මෙම ලකුණු ලබා දෙනු ඇත) | 10 | |
| (5) සම්මුඛ පරීක්ෂණය සඳහා<br>(ප්‍රායෝගික හැකියාව හා උසාවි රාජකාරි පිලිබඳ) | 10 | |
| එකතුව | 100 | |

**3.3<u>උසස් කිරීමේ ක්‍රමය:</u>**

අයදුම්පත් කැඳවන දිනට ඉහත 3.1 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුරාබදු සැරයන් තනතුරට උසස් කරනු ලැබේ.

එම්.ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

එම්.ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක. 353, කෝට්ටේ පාර, රාජගිරිය.

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ**

**සුරාබදු කෝප්‍රල් තනතුරේ සිට සැරයන් තනතුරට සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීමේ ඉල්ලුම් පත්‍රය- 2022**

1.නිළධාරියාගේ සම්පූර්ණ නම.................................................................................................

2.තනතුර හා සේවා අංකය......................................................................................................

3.ලිපිනය: (1) කාර්යාලය......................................................................................................

(2)පුද්ගලික..................................................................................................................

4.දැනට සේවය කරන ස්ථානය....................................................................................................

5. උපන් දිනය :

........... දිනට වයස : අවුරුදු : ........... මාස : ............... දින: ......................

6. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

7.මුල් පත්වීම දිනය: ................................

8.පත්වීම ස්ථිර කල දිනය : ......................

9.කාර්යක්ෂමතා කඩඉම සමත් වීම (1)................

(2)................

10.ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :.................................................

(පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග සඳහන් කරන්න)

11.ජාතිය : ................................

12.විවාහක ද/ අවිවාහක ද යන වග.......................

13.ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

14.දැනට දරණ තනතුර හා ඊට පත් කල දිනය ..................................................................

15.සුරාබදු නියාමක තනතුරට පත් වූ දිනය .....................

16.යහපත් කල් ක්‍රියාව සඳහා වූ රන්වන් ලාංජන ලබා තිබේද :ඔව්/නැත

17.පසුගිය වසර පහ (5) තුළදී යම් කිසි දඬුවමක් හෝ වැටුප් වර්ධක දඬුවමක් ලබා තිබේද?..................

18. පසුගිය වසර පහ (5) තුළදී යම් කිසි දෝෂාරෝපණයකට නොවැඩි දඬුවමක් හෝ අසාධු සටහනක් ලබා තිබේද?............................ (එසේ නම් විස්තර සපයන්න)

19.ඔබ ලබා ඇති සාධු සටහන්: විශේෂ සාධු සටහන්.................

සාමාන්‍ය සාධු සටහන්..............

20.අදාල මට්ටමේ භාෂා ප්‍රවීනතාවය ලබා තිබේද: ඔව්/නැත

21. සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකින් වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර ..............................................................................................................

..............................................................................................................................

22. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද මෙහි සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය

වුවහොත් මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි.

දිනය ..........................                                        ..................................

අයදුම්කරුගේ අත්සන

23.නිර්දේශය

- ක්ෂේත්‍ර වැඩ - ඉතා හොඳයි/හොඳයි/සතුටුදායකයි/ /දුර්වලයි
- කායික වර්ධන හා ඩ්‍රිල් - ඉතා හොඳයි/හොඳයි/ සතුටුදායකයි /දුර්වලයි
- සාමාන්‍ය හැසිරීම හා අවංක භාවය -ඉතා හොඳයි/හොඳයි/ සතුටුදායකයි /දුර්වලයි
- නායකත්වය පිළිබඳ ශක්තිය - ඉතා හොඳයි/හොඳයි/ සතුටුදායකයි /දුර්වලයි

දිනය : ........................                                        ..................................

සුරාබදු ස්ථානාධිපති

අත්සන හා නිල මුද්‍රාව

සුරාබදු අධිකාරීගේ නිරීක්ෂණ හා නිර්දේශය :

දිනය : ........................                                        ..................................

සුරාබදු අධිකාරීගේ

අත්සන හා නිල මුද්‍රාව

සහකාර සුරාබදු කොමසාරිස්ගේ නිරීක්ෂණ හා නිර්දේශය :

දිනය : ........................                                        ..................................

සහකාර සුරාබදු කොමසාරිස්ගේ

අත්සන හා නිල මුද්‍රාව